මගේ අංකයා:- ග/ ගෙවීම් 93/22

මගේ අංකයා:- ගෙ/1/04.
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සංස්කෘතික
කටයුතු අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

1993 නොවැම්බර් මස 02 දින.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සංස්කෘතික
කටයුතු අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්,
ආයතන ප්‍රධානීන් හා අනුබද්ධ ආයතන ප්‍රධානීන් වෙත.

## 1993 මුදල් වර්ෂයේ ගිණුම් පියවීම්.

1993 වර්ෂය තුළ කරන ලද සැපයීම් හා සේවාවන් වෙනුවෙන් සියලුම ගෙවීම් 1993. 12. 31 දින 24.00 පැයට පෙර නිමකළ යුතුව ඇත. මේ සම්බන්ධයෙන් මු. රෙ. 217 (1) හා (2) ට ඔබේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. 1993 ගිණුම් වර්ෂයට අදාල සියලුම ගෙවීම් 91.12.31 දින 24.00 පැය වන විට නිම කර මුදල් පොත සහ අනෙකුත් ලෙජර්වල කටයුතු අවසන් කර තිබිය යුතු බව මහා භාණ්ඩාගාරය විසින් අවධාරණය කර ඇති අතර මේ සම්බන්ධයෙන් විගණකාධිපතිගේ විශේෂ අවධානය ද යොමු වී ඇති බව දන්වනු කැමැත්තෙමි. අංක බී කෝ/4/93 හා ජුලි 20 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති නව මුදල් කළමනාකරණ ක්‍රමය අනුව පුනරාවර්ථන වියදම් වෙනුවෙන් දිනපතා මුදල් පොතේ ලියා නිකුත් කෙරුණ චෙක්පත්වල මුළු එකතුවට "භා.නි.ලේ. ගේ ගෙවීම් පහසුකම් ගිණුමෙන්" මුදල් ලබා ගැනීම සඳහා දිනපතා දවසේ වියදම වෙනුවෙන් චෙක්පතක් බැංකුවට ඉදිරිපත් කළ යුතුය. මේ අනුව අනිවාර්යයෙන්ම දෙසැම්බර් 31 දින වර්ෂයේ දරා ඇති පුනරාවර්ථන වියදම් වෙනුවෙන් ගෙවීම් අවසන් කිරිමට සිදුවේ.

03. කරුණු එසේ හෙයින් 1993 වර්ෂයේ ඔබ ශාඛාවට/ආයතනයට අදාල සියලුම ගෙවීම් සඳහා වූ වවුචර් හා ගමන් වියදම් ඉල්ලුම්පත් ආදිය ගෙවීම සඳහා අමාත්‍යාංශයේ ගෙවීම් ශාඛාවේ ගණකාධිකාරී වෙත පහත සඳහන් කර ඇති දිනයන්ට පෙර ඉදිරිපත් කළ යුතුය.

I) පුනරාවර්තන වියදම් සඳහා වන වවුචර් - 1993. 12. 17 දින හෝ ඊට පෙර

II) ප්‍රාග්ධන වැය ශීර්ෂවලින් ගෙවන වවුචර් - 1993. 12. 20 දින හෝ ඊට පෙර

III) ඉන්ධන අත්තිකාරම් පියවීමේ වවුචර් - 1993. 12. 27 දින හෝ ඊට පෙර

IV) දෙසැම්බර් මාසයේ අතිකාල දීමනා වවුචර් - 1993. 12. 29 දින හෝ ඊට පෙර (94 ජනවාරි මාසයේදී ද ගෙවිය හැකිය.

(IV) දෛනික වැටුප් හා පුහුණු අයගේ දෙසැම්බර් මස පැමිණීමේ ලේඛන (93. 12. 27 දක්වා) 93. 12. 28 හෝ එදිනට පෙර (94 ජනවාරි මාසයේදී ද ගෙවිය හැකිය.)

04. ඔබ හෝ ඔබේ අනුමැතිය යටතේ යම් නිලධාරියෙකු අග්‍රිම අත්තිකාරම් මුදල් ලබාගෙන ඇත්නම් ඒවා පියවීම සඳහා වන වවුචර් ද නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 27:7 වගන්තියට හා මු.රෙ. 371 (4) ට ඔබේ අවධානය යොමු කරවමි. සේවාස්ථ සැසි වැඩමුළු දෙසැම්බර් මස අග භාගයේ පැවැත්වීමට

දිනටමත් සැලසුම් කර ඇත්නම් ඉහත 03 වන ඡේදයේ සඳහන් දිනට හෝ ඊට පෙර ගෙවීම් සඳහා වවුචර් ඉදිරිපත් කළ හැකි පරිදි එම දිනයන් වෙනස්කර ගන්නා ලෙස ද කරුණාවෙන් සටහන් කර ගන්න.

05. ඉහත කරුණු පිළිබඳව ප්‍රමුඛත්වය දී කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටින අතර 1993 වර්ෂයේ බැඳීම් වෙනුවෙන් 1994 වර්ෂයේදී ගෙවීම් කළ නොහැකි අතර එම බැඳීම් සම්බන්ධයෙන් **අදාළ නිලධාරීන්ට පෞද්ගලිකව වගකීමට සිදුවන බව ද අවධාරණය කරවමි.** (මු. රෙ. 217 (1))

06. මෙම චක්‍රලේඛය ලැබුණු බව හා එහි විධිවිධාන අනුව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලද බව පහත ඇති කොටස සම්පූර්ණ කර ගණකාධිකාරී (ගෙවීම්) වෙත එවීමෙන් තහවුරු කරන්නේ නම් මැනවි.

ඩී. කේ. පලිහවඩන,
ප්‍රධාන ගණකාධිකාරී,
අධ්‍යා. උ. අධ්‍යා. හා සං. ලේ. වෙනුවට.

---

මගේ අංකය:- ..............................
.................................... ශාඛාව,
1993 ................. දින.

ගණකාධිකාරී (ගෙවීම්)

1993 වර්ෂයේ ගිණුම් පියවීම පිළිබඳව අංක...................... හා .................................. දිනැති චක්‍රලේඛය ලැබුණ බවත් එහි සඳහන් විධිවිධාන අනුව කටයුතු කිරීමට සටහන් කරගත් බවත් කරුණාවෙන් දන්වමි.

අත්සන :-

නම :-

තනතුර :-